# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 90 — 1973 දෙසැම්බර් 14 වැනි සිකුරාදා — 1973.12.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | | පිට | | | පිට |
|---|---|---|---|---|---|
| සම්මත වූ පනත් | ... | (අතිරේක) | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම | ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් මහාධිකරණයේ දැන්වීම | ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් | ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම | ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් | ... | 221 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් | ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම | ... | — | නොතාරිස් ලැයිස්තුව | ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම | ... | — | විවිධ දැන්වීම් | ... | — |



සැළකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 45 දරණ ලොරි බලකර ලබා ගැනීමේ සහ අත්කර ගැනීමේ පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 46 දරණ ධීවර (සංශෝධන) පනත 1973 දෙසැම්බර් මස 14 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

## මුදල් නඩු පිළිබඳ දැන්වීම්

පානදුරේ දිස්ත්‍රික් උසාවියේ දිය

නයිසයි ආඥාවයි

අළුබෝමුල්ලේ, පෙරේරා මාවතෙහි පදිංචිව සිට නැසීගිය විජේසේකර ආරච්චිගේ දොන් සේතන් නොහොත් සේදිරිස් පෙරේරාගේ අන්තිම කැමැති පත්‍රයක් නොමැති මුදලේ කරුණ පිළිබඳවයි.

මියගිය අය.

ගන්ධාරගාම, වීදාගම, "විජය" හි පදිංචි විජේසේකර ආරච්චිගේ දොන් කොර්නේලිස් පෙරේරා ........................ පෙත්සම්කරු.

තෙස්තාමේන්තු නඩු නො: 1,280 විරුද්ධව

(1) අළුබෝමුල්ලේ, පෙරේරා මාවතෙහි පදිංචි විජේසේකර ආරච්චිගේ දෝන ඇලන් නෝනා නොහොත් පොඩිනෝනා මඩපාත, පොල්ගේනේ පදිංචි කරුවන් වන, (2) හෙට්ටිගේ කර්ලැයින් පෙරේරා, (3) හෙට්ටිගේ මංග්‍රට් පෙරේරා, (4) හෙට්ටිගේ එව්ජින් පෙරේරා, (5) හෙට්ටිගේ ලිලී පෙරේරා, (6) හෙට්ටිගේ සෙලෙස්තිනා පෙරේරා, (7) අළුබෝමුල්ලේ පෙරේරා මාවතෙහි පදිංචිකරුවන් වන, විජේසේකර ආරච්චිගේ දෝන ආරියලතා, (8) විජේසේකර ආරච්චිගේ දෝන චන්ද්‍රිකා, (9) විජේසේකර ආරච්චිගේ දෝන ජයන්තා, (10) විජේසේකර ආරච්චිගේ දෝන ජයතිලකා, (11) විජේසේකර ආරච්චිගේ දොන් චන්ද්‍රසිරි, (12) විජේසේකර ආරච්චිගේ දොන් සාන්ත, (13) අළුබෝමුල්ලේ පෙරේරා මාවතෙහි පදිංචි සූරියආරච්චිගේ දෝන කුසුමාවතී ..........

8 වෙනි පටන් 12 වෙනි දක්වා වගඋත්තරකරුවන් බාලවයස් කරුවන් බැවින් ඔවුන්ගේ නීත්‍යානුකූල භාරකාරිය වශයෙන් 13 වෙනි වගඋත්තරකාරී පෙනී සිටී.

............................................................ වගඋත්තරකරුවෝ.

වර්ෂ 1973 ක් අගෝස්තු මස 22 වෙනි දින පානදුරේ අතිරේක දිසා විනිසුරු තැන්පත් කේ. වී. ස්වර්ණාධිපති මහතාණන් ඉදිරිපිට පෙත්සම්කරු වෙනුවෙන් "ස්තෝම්බු සහ ස්තෝම්බු" ව්‍යාපාරය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1972 ජනවාරි 7 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

---

යටතේ කටයුතු කරන සිරිල් ක්‍රිස්ටෝපර් ස්තේම්බු සහ උසන්තා ජෝර්ජ් ඒබ්‍රහම් ස්තේම්බු, නීතිඥ මහතුන් පෙනී සිටියදී, මෙම කරුණ සුදුස්සක් සඳහා ඉදිරිපත් වූ හෙයින්, ඉහත කී පෙත්සම්කරුගේ 1973.8.22 වෙනි දින දරණ දිව්රුම් ප්‍රකාශය හා 1973.8.22 වෙනි දින දරණ පෙත්සම කියවා බලා,

ඉහත කී වගඋත්තරකරුවන් හෝ මෙ සම්බන්ධයෙන් සැලකිලිමත් වන අන් අයෙක් හෝ අයවලුන් විසින් වර්ෂ 1973 හි ඔක්තෝබර් මස 30 වෙනි දින් හෝ එයට පෙර මෙම උසාවියට ඒත්තු යනාකාර සැහෙන විරුද්ධවාදිකම් ඉදිරිපත් නොකළහොත් ඉහත කී පෙත්සම්කරු නැසීගිය අයගේ වැඩිමහලු සහෝදරයා වශයෙන්, නැසීගිය අයගේ බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාත් බලකරු වශයෙන් පත්කොට, එකී අද්මිනිස්ත්‍රාත් බලපත්‍රය ඔහුට නිකුත් කරනු ලබන බවත්,

ඉහත කී 13 වෙනි වගඋත්තරකාරී මෙම නඩුවේ සියළුම කටයුතු සඳහා 8 වෙනි පටන් 12 වෙනි දක්වා බාලවයස්කාර-වගඋත්තරකරුවන්ගේ නීත්‍යානුකූල-භාරකාරිය වශයෙන් පත්කරන ලබන බවත් මෙයින් නියෝග කරනු ලැබේ.

තවද ඉහත කී 13 වෙනි වගඋත්තරකාරී විසින් ඉහත කී 8 වෙනි පටන් 12 වෙනි දක්වා බාලවයස්කාර වගඋත්තරකරුවන් එදිනට මෙම උසාවිය වෙත ඉදිරිපත් කරන ලෙසටද මෙයින් නියෝග කරනු ලැබේ.

කේ. වී. ස්වර්ණාධිපති,
අතිරේක දිසාවිනිසුරුතුමා.

වර්ෂ 1973 ගි අගෝස්තු මස 22 වෙනි දින.

මෙම නයිසයි ආඥාවට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමේ දිනය 1974.1.8 දක්වා දීර්ඝ කරන ලදී.

1973.10.30.

කේ. වී. ස්වර්ණාධිපති,
අතිරේක දිසාවිනිසුරුතුමා.

12–424—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## මාතර දිස්ත්‍රික් උසාවියේ දීය
### නයිසයි ආඥාවයි

තංගල්ලේ වල්ගම්එලියේ පදිංචිව සිට නැසීගිය, පටබැඳි මද්දුමාගේ සැම් ද සිල්වාගේ අන්තිම කැමැත්තක් නොමැති බූදලය පිළිබඳ කාරණාව ගැනයි.

තංගල්ලේ, වල්ගම්එලියේ පදිංචි, මැපිල්ඩා ගුනසේකර ........................................................ පෙත්සම්කාරිය.

බූදල් නඩු අංකය ; 5,307 එදිරිව

(1) තංගල්ලේ, වල්ගම්එලියේ පදිංචි, පටබැඳි මද්දුමාගේ වජිර ද සිල්වා, (2) තංගල්ලේ, වල්ගම්එලියේ පදිංචි, පටබැඳි මද්දුමාගේ කපිල ද සිල්වා, (3) තංගල්ලේ, වල්ගම්එලියේ පදිංචි, පටබැඳි මද්දුමාගේ අමාලි ද සිල්වා, (4) හම්බන්තොට පදිංචි, රත්සි ද සිල්වා ........................ වගඋත්තරකරුවෝ.

පෙත්සම්කාරිය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ ඒ. ඊ. බුල්ජන්ස් මහතා සහ ඔහුගේ සහායක ආර්. එල්. වී. ද සිල්වා මහතා පෙනී සිටියදී වර්ෂ 1973 සැප්තැම්බර් මස 8 වන දින මාතර දිසා විනිසුරු තැන්පත් ජේ. එෆ්. ඒ. සෝසා මැතිතුමා ඉදිරිපිටදී මෙම කාරණය ගැන සුදුස්සක් කිරීමට ගෙන පෙත්සම්කාරියගේ 1973.9.04 වන දින දරණ දිවුරුම් ප්‍රකාශය ද කියවා බැලීමෙන් පසු :

ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් විසින් හෝ මෙම කාරණාව සම්බන්ධව උනන්දුවක් දක්වන වෙනත් අයෙකු විසින් හෝ 1973 දෙසැම්බර් මස 21 වන දිනට හෝ ඊට පෙර හෝ මෙම අධිකරණය සෑහීමට පත්වන අයුරු විරුද්ධ කාරණා ඉදිරිපත් නොකළහොත් නැසීගිය තැනැත්තාගේ වැන්දඹුව වශයෙන් එකී පෙත්සම්කාරියට එකී නැසීගිය තැනැත්තාගේ බූදලය හා දේපළ පරිපාලනය කිරීමට හිමිකම් ඇති බව ද ඒ අනුව එකී පෙත්සම්කාරියට එකී දේපළ හා බූදලය පරිපාලනය කිරීම සඳහා බූදල් පරිපාලන බලපත්‍රය නිකුත් කරනු ලබන බව ද මෙයින් නියෝග කොට ප්‍රකාශ කරනු ලැබේ.

තවද, ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් විසින් හෝ මෙම කාරණාව සම්බන්ධව උනන්දුවක් දක්වන වෙනත් අයෙකු විසින් හෝ 1973 දෙසැම්බර් මස 21 වන දිනට හෝ ඊට පෙර හෝ මෙම අධිකරණය සෑහීමට පත්වන අයුරු විරුද්ධ කාරණා ඉදිරිපත් නොකළහොත්, මෙම නඩුවේ වැඩකටයුතු ගෙනයාම සඳහා ඉහත කී බාලවයස්කාර 1 සිට 3 දක්වා වගඋත්තරකරුවන්ගේ භාරකරු වශයෙන් ඉහත කී 4 වන වගඋත්තරකරු පත්කරනු ලබන බව ද මෙයින් වැඩිදුරටත් නියෝගකොට ප්‍රකාශ කරනු ලැබේ.

ජේ. එෆ්. ඒ. සෝසා,
දිසා විනිසුරු.

1973 සැප්තැම්බර් 8 වන දින.

12–516—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිසා අධිකරණය
### නයිසයි ආඥාවයි

උඩුවෙ සිට නැසීගිය වැලිපිටියේ මුදියන්සේලාගේ කරුණාසේන හෙවත් කරුණාසේන බන්ඩාරගේ උරුමය නොපැවරූ දේපල පිළිබඳ කරුණ ගැනයි.

උඩුවෙ පදිංචි කස්තුරිසිංහ මුදියන්සේලාගේ සීලවතී කුමාරිහාමි ........................................................ පෙත්සම්කාරි.

අංක 2,200/පී. එදිරිව

(1) උඩුවෙ පදිංචි වැලිපිටියේ මුදියන්සේලාගේ අබේරාජ බන්ඩාර වැලිපිටිය, (2) උඩුවෙ පදිංචි වැලිපිටියේ මුදියන්සේලාගේ මංගලිකා කුමාරිහාමි වැලිපිටිය. (1 සහ 2 වගඋත්තරකරුවන් බාලවයස් කරුවන් බැවින් නඩුවේ භාරකරු තුන්වැනි වගඋත්තරකරු). (3) උඩුවෙ පදිංචි වැලිපිටියේ මුදියන්සේලාගේ ධර්මසේන බංඩාර (1 සහ 2 බාලවයස්කාර වගඋත්තර කරුවන්ගේ නඩුවේ භාරකරු) .................... ........................................................ වගඋත්තරකරුවෝ.

මෙම කාරණය 1969 ජූලි මස 14 වැනි දින කෑගල්ලේ දිසා විනිසුරු ජේ. සී. ඊ. ද අල්විස් මැතිතුමා ඉදිරියේ ඉහත නම් සඳහන් පෙත්සම්කාරිය වෙනුවෙන් නීතිඥ ඊ. අබේවික්‍රම මහතා පෙනී සිටිමින් මෙම කරුණ විනිශ්චයට භාජනව පෙත්සම්කාරියගේ 1969 මාර්තු මස 13 දින දරණ දිවුරුම් පත සහ පෙත්සම කියවන ලදින් ඉහත නම් සඳහන් 3 වැනි වගඋත්තරකරු ඉහත සඳහන් 1 සහ 2 බාලවයස්කාර වගඋත්තරකරුවන් නියෝජනය කිරීම පිණිස මෙම පටිපාටිකරය සඳහා ඔවුන්ගේ භාරකරු වශයෙන් මෙයින් පත්කරනු ලැබූ බව නියෝග කරනු ලැබේ.

තවද ඉහත නම් සඳහන් වගඋත්තරකරුවන් හෝ මේ සම්බන්ධයෙන් ඇති වෙනයම් අයෙක් හෝ අයවලුන් විසින් 1973 දෙසැම්බර් මස 19 දින හෝ ඊට පෙර මෙම අධිකරණයට පිළිගත හැකි ප්‍රමාණවත් විරුද්ධතාවයක් නොදැක්වුවහොත් ඉහත නම් සඳහන් නැසීගිය තැනැත්තාගේ වැන්දඹුව වශයෙන් ඉහත නම් සඳහන් පෙත්සම්කාරියට එකී නැසීගිය තැනැත්තාගේ බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලය හිමිවිය යුතු බව මෙයින් හිමිකර ප්‍රකාශ කරන බව වැඩිදුරටත් නියෝග කරනු ලැබේ.

තවද එකී 3 වැනි වගඋත්තරකරු ඉහත නම් සඳහන් 1 සහ 2 දක්වා වූ බාල වයස්කාර වගඋත්තරකරුවන් 1973 දෙසැම්බර් මස 19 දින පෙරවරු 9 ට මෙම අධිකරණයට ඉදිරිපත් කළ යුතු බවද, වැඩිදුරටත් මෙයින් නියෝග කරනු ලැබේ.

සී. ඊ. ධර්මසේකර,
දිසා විනිසුරු.

1973 නොවැම්බර් මස 30 වැනි දින.

12–480—72.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| දෙසැම්බර් | ... | 73.12.07 | සිකුරාද | ... | 73.11.30 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.12.14 | සිකුරාද | ... | 73.12.07 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.12.21 | සිකුරාද | ... | 73.12.14 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.12.28 | සිකුරාද | ... | 73.12.21 | සිකුරාද | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.